**හෝමියෝපති වෛද්‍ය සභාව - 2018**

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනත | | | |
| (i) 28 (6) වගන්තිය | ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනාගැනීමට, හිඟහිටි ගාස්තුව හඳුනාගැනීමට හා ලියාපදිංචිය වාර්ෂිකව අළුත් කර ඇති බව තහවුරු කර ගැනීමට හැකි පරිදි හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | හෝමියෝපති පනතට අනුව වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සභාව විසින් සම්මතකර නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත්කර ඇති බව, එය පාර්ලිමේන්තුවේ සම්මතකර ගැසට් පත්‍රයේ පළ කිරීම මෙතෙක් සිදුවී නොමැති බව හා ඒ හේතුවෙන් මෙම ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත නොහැකි බව. | නව රෙගුලාසි සම්මත කර ගැසට් පත්‍රයේ පළ කරන තෙක් පැරණි රෙගුලාසි අනුව වෛද්‍යවරු ලියාපදිංචි කළ යුතුය. ඒ අනුව වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 51 (1) හා 51(2) වගන්ති | නව වෛද්‍ය සභාව පත්කරන තෙක් සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා අමාත්‍යවරයා විසින් පත්කර තිබුණු අතුරු වෛද්‍ය සභාවේ කාලසීමාව 2018 ඔක්තෝබර් 19 දින අවසන් වී තිබුණි. නමුත් පනතේ විධි විධාන ප්‍රකාරව නව වෛද්‍ය සභාව 2019 සැප්තැම්බර් 10 දින වන විටත් පත්කර නොතිබුණි. | වෛද්‍ය සභාව පත්කිරීමට අවශ්‍ය රෙගුලාසි නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර තිබුණද එහි කටයුතු අවසන් නොවීම හා ගරු අභියාචනාධිකරණය විසින් දී ඇති නඩු තීන්දුවක් මගින් වෛද්‍ය සභා නිලවරණයේදී ඡන්දය පාවිච්චි කළ හැකි වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් මතුවී ඇති ගැටලුකාරී තත්වය මේ සඳහා හේතුවී ඇති බව. | පනතේ විධි විධාන ප්‍රකාරව, නව වෛද්‍ය සභාව පත් කර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 | සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණනයන් සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1වගන්තිය | 2014 හා 2015 වර්ෂවලදී බඳවාගෙන තිබුණු ඖෂධ සංයෝජකවරු 7 දෙනෙකු හා වෛද්‍ය නිලධාරින් 7 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග 2019 සැප්තැම්බර් 10 දින වන විටත් පවත්වා නොතිබුණි. | විෂය නිර්දේශයන් හඳුනා ගැනීමේ අපහසුව හා කාර්ය මණ්ඩල හිඟකම නිසා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම ප්‍රමාද වූ බව, එම විභාග සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විභාග අංශය වෙතින් පැවැත්වීමට විෂය නිර්දේශ හා ආදර්ශ ප්‍රශ්න පත්‍ර පිළියෙල කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම කඩිනම් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2014 අගෝස්තු 13 දිනැති අංක පීඊඩී 25 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවත්, 2009 වර්ෂයේදී අයකර තිබුණු පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකු ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.1,787,552 ක් විය. | පෞද්ගලික බැංකු ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර ඇති මුදල් රජයේ බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීම සඳහා අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ඉල්ලා ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

## 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී, හෝමියෝපති ඖෂධ සංයෝජකයන් පුහුණු කිරීමට, ඇගයීමට හා සහතික ලබාදීමට සහ හෝමියෝපති ඖෂධ හා විලවුන් ආනයනය, අලෙවිය හා පිළියෙල කිරීම පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීමට සැලසුම්කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. 2019 සැප්තැම්බර් 10 දින වන විටත් එම ක්‍රියාකාරකම්වල ප්‍රගතියක් දැකිය නොහැකි විය. | ඖෂධ සංයෝජක තනතුර සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාවක් පිළියෙල කිරීමට අදාළ ආයතන සමඟ කටයුතු කළ නමුත් 2018 වර්ෂය අවසානය වන විටත් එම කාර්ය ඉටුකර ගැනීමට නොහැකි වීම මේ සඳහා හේතු වූ බව. | හෝමියෝපති වෛද්‍ය සභා පනතෙහි අරමුණු ඉටු කර ගැනීමට හැකි පරිදි සැළසුම් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | හෝමියෝපති පනතේ 30 (I) වගන්තිය ප්‍රකාරව, වර්ෂ 5 කට වඩා හෝමියෝපති වෛද්‍ය කර්මයෙහි නියුක්තව සිටි වෛද්‍යවරුන් වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන විභාගයෙන් සමත්වීමෙන් පසු හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි කළ යුතුවේ. සමාලෝචිත වර්ෂයේදී මෙම විභාගය පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණු අතර අයදුම්පත් 189 ක් ලැබී තිබුණි. විභාගය පැවැත්වීම සඳහා නීති සම්පාදනය කිරීම අවසන් කර නොතිබීම හා වෛද්‍ය සභාවේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතීම හේතුවෙන් මෙම වාර්තාවේ දිනය වන විටත් විභාගය පැවැත්වීමට හා වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට නොහැකිවී තිබුණි. | අදාළ නීති සම්මත කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව, වෛද්‍ය සභාවේ කටයුතු සම්බන්ධයෙන් ගරු අභියාචනාධිකරණය විසින් ලබාදී ඇති නඩු තීන්දුවට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර ඇති අභියාචනයේ තීන්දුව ලැබෙන තෙක් නීති සම්මත කර ගැනීමේ කටයුතු ඉදිරියට ගෙනයාම ගැටළුවක් වන බව හා මේ අවස්ථේදී අනුගමනය කළ යුතු පියවරයන් සම්බන්ධව ගරු නීතිපති තුමාගෙන් උපදෙස් විමසා ඇති බව. | නීතිපතිගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සායන සඳහා පැමිණෙන රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව ඖෂධ බහාලුම් ලෙස පාවිච්චි කරන ප්ලාස්ටික් ඩප්පි හා කඩදාසි කවර හෝමියෝපති සායන වෙත බෙදාහැර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.1,070,487 ක් වූ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඩප්පි 373,752 ක් සහ කවර 392,389 ක් වෛද්‍ය සභා කාර්යාලය හා සායන තුළ ඉතිරිවී තිබුණු අතර ඒවා විනාශවීමේ හෝ කල් ඉකුත්වීමේ අවධානමක් පැවතුණි. එම තොග සම්බන්ධ ලෙජර් ගිණුම් පවත්වාද නොතිබුණි. | හෝමියෝපති වෛද්‍ය සායන 07 ක් රට තුළ පිහිටා ඇති බව, ඖෂධ බහාලුම් කවර සහ ඩප්පි නිරන්තරයෙන් සැපයීම වෙනුවට, වෛද්‍යවරුන්ගෙන් ලබාගත් ඇස්තමේන්තු සැලකිල්ලට ගෙන සායන වෙත ඒවා නිකුත් කර ඇති බව, සහා කාර්යාලය හා සායන තුළ කවර සහ ඩප්පි තොග ඉතිරිවී තිබුණු නමුත් ඒවා 2019 වර්ෂයේදී භාවිතයට ගත් බව. | මෙම ප්ලාස්ටික් ඩප්පි හා කඩදාසි කවර සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් පවත්වා ගත යුතුය. විධිමත් තොග පාලනයක් පවත්වාගත යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යන සායන 7 න් සායන 6 ක රෝගීන්ගේ සමස්ථ සහභාගීත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10 කින් වැඩි වී තිබුණද, එක් සායනයක රෝගීන්ගේ සහභාගීත්වය 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 10 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අඩුවීම සියයට 29 දක්වා වර්ධනය වී තිබුණි. | 2017 වර්ෂයේදී පාලමුනෙ හෝමියෝපති සායනයට මැර ප්‍රහාරයක් එල්ල කර උපකරණවලට බරපතල හානි කළ බව හා එම තත්ත්වය රෝගී සහභාගීත්වය අධෛර්ය වීමට හේතු වූ බව. | ඉදිරියේදී රෝගීන්ගේ සහභාගීත්වය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

-------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු හා උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කර නොතිබීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 10 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. මිලදීගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ගොඩනැගිල්ල වර්ෂ 09 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය ආරම්භ කිරීමට අවශ්‍ය නීතිමය කටයුතු හා භෞතික ඉදිකිරීම් සඳහා වන මූලික පියවරයන් වෙත මේ වන විට යොමු වී ඇති බව. | ගොඩනැගිලි ඉදිරිකිරීමට හා උපකරණ සපයා ගැනීමට පෙර වෛද්‍ය විද්‍යාලය පිහිටුවීම සඳහා වන රෙගුලාසි හා නීති සම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඉදිකර ඇති ගොඩනැගිල්ල හා මිලදී ගෙන ඇති ලී බඩු උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 20 (2) වගන්තිය හා 2016 අංක 10 දරන නව හෝමියෝපති පනතේ 18 (1)(අ) වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි තනතුර තාවකාලික තනතුරක් වුවද, 2012 ඔක්තෝබර් 16 දින එම තනතුරට ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. මෙම තනතුර ස්ථිර තනතුරක් ලෙස සලකා පිළියෙල කර තිබුණු බඳවාගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. නමුත් පනතේ විධි විධානවලට අනුගත වන පරිදි බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කර අනුමත කරවා ගැනීමට හෝ අවශ්‍ය පරිදි පනත සංශෝධනය කර ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද අනුමත බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව, පත්වීමේ දින සිට වර්ෂ 3 ක් වූ පරිවාස කාලය තුළ අදාළ නිලධාරියා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය. එම විභාගය 2019 සැප්තැම්බර් 10 දින වන විටත් පවත්වා නොතිබුණු බැවින් පරිවාස කාලය දීර්ඝ කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී නොතිබුණු නමුත් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී වාර්ෂික වැටුප් වර්ධක 4 ක් අදාළ නිලධාරියා වෙත ලබා දී තිබුණි. | ලේඛකාධිකාරි තනතුර ස්ථිර කාර්ය මණ්ඩල තනතුරක් බවට පත්කර ගැනීමට 1970 අංක 07 දරන හෝමියෝපති පනතින් බාධාවක් නැති බව, ලේඛකාධිකාරී ඇතුළු හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය ස්ථිර තනතුරු සහිත කාර්ය මණ්ඩලයක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇති බව, 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 18 (1) අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී තාවකාලික තනතුරක් බවට පත් කර තිබුණ ද එම පනතේ 50(2) (ඉ) වගන්තියට අනුව ලේඛකාධිකාරී තනතුරේ තාවකාලික ස්වභාවය වර්තමාන තනතුරේ සේවය කරන නිලධාරීයාට බල නොපාන බව, 2016 අංක 10 දරන හෝමියෝපති පනතෙහි අවශ්‍ය සංශෝධනයන් සඳහා කටයුතු ආරම්භ කර ඇති බව හා වත්මන් ලේඛකාධිකාරීගේ පරිවාස කාලය කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වන තෙක් දීර්ඝ කිරීමට අතුරු වෛද්‍ය සභාව තීරණය කර ඇති බව. | 2016 අංක 10 දරන නව හෝමියෝපති පනතේ 18 (1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය හෝමියෝපති පනතෙහි දක්වා ඇති විධිවිධාන වලට අනුගත වන පරිදි පිළියෙල කළ යුතුය. නොඑසේ නම් අදාළ පරිදි පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබුණු කිසිදු ක්‍රියාකාරකමක් සඳහා වූ ඇස්තමේන්තු ගත පිරිවැය හෙළිදරව් කර නොතිබුණි. | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, හෝමියෝපති ඖෂධ සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සියළු සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මානව සහ මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවූ බැවින් මෙම වැඩසටහන ඉදිරි වර්ෂ වලදී ක්‍රියාවට නැගීමට තීරණය කළ බව. | හෝමියෝපති වෛද්‍ය සභාවේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට හැකි වන පරිදි, එක් එක් ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇතුළත් කර, තාත්වික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර ක්‍රියාත්මක කළ යුතුය. |